

වාර්ෂික වාර්තාව 2022
ஆண்டு அறிக்கை 2022
ANNUAL REPORT 2022

ජය කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ්

ஜய கன்டேனர் டர்மினல்ஸ் லிமிடெட்

Jaya Container Terminals Limited

පටුන

01. අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව..... **1**

02. සභාපතිවරයාගේ පණිවිඩය **4**

03. සමාගම හඳුන්වාදීම **5**

04. කළමනාකරණ කණ්ඩායම..... **8**

05. අංශමය කාර්යසාධනය..... ..... **9**

06. ආයතනික පාලනය..... **24**

07. විගණන කමිටු වාර්තාව..... **25**

08. විගනිත මූල්‍ය ප්‍රකාශ..... **27**

අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා සමාගමේ මූල්‍ය ප්‍රකාශය සහ එහි විගණකාධිපතිවරයාගේ වාර්තාව සමග ජයා කන්ටේනර් ටර්මිනල් ලිමිටඩ් හි වාර්ෂික වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සතුටින් ඉදිරිපත් කර සිටී.

නෛතික තත්ත්වය

ජයා කන්ටේනර් ටර්මිනල් ලිමිටඩ් 1982 සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාපිත සහ පිහිටි සහ 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ නැවත ලියාපදිංචි කළ සීමිත වගකීමක් සහිත සමාගමකි.

සමාගමේ ලියාපදිංචි කාර්යාලය කොළඹ 01, පල්ලිය වීදිය අංක 19 හි පිහිටා ඇති අතර ව්‍යාපාරය කොළඹ 15 වෝල්ස් පටුමගේ අංක 69 හි ස්ථාපිතව ක්‍රියාත්මක කෙරේ.

ප්‍රධාන කටයුතු

ජයා කන්ටේනර් ටර්මිනල් ලිමිටඩ් හි ප්‍රධාන කටයුතු වන්නේ බිලූමැන්ඩල්වල (අංක 69, වෝල්ස් පටුමඟ, කොළඹ 15) පිහිටි කොළඹ තෙල් බැංකුව කළමනාකරණය කර ක්‍රියාත්මක කිරීම වන අතර එය ශ්‍රී ලංකා වරාය අධිකාරියේ (SLPA) බන්ධිත ගුදමකි. අප ආයතනයේ, කොළඹ තෙල් බැංකුවේ මෙහෙයුම් කරගෙන යාම සඳහා කළමනාකරණ සේවා ගිවිසුමක් යටතේ කළමනාකරණ නියෝජිතයෙක් ලෙස ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් පත්කර ඇත.

මූල්‍ය ප්‍රකාශන

2023.02.17 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ පිටු අංක 33 සිට 71 දක්වා ඉදිරිපත් කෙරේ.

විගණකගේ වාර්තාව

සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිගේ වාර්තාව පිටු අංක 24 සිට 32 දක්වා ඇත.

ගිණුම්කරණ ප්‍රතිපත්ති

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති 40 සිට 51 දක්වා පිටුවල සඳහන් වන අතර පසුගිය වසරට සාපේක්ෂව එකි ප්‍රතිපත්තිවල කිසිදු වෙනසක් සිදු වී නොමැත.

අඛණ්ඩ පැවැත්ම

අධ්‍යක්ෂ මණ්ඩලය දැකියහැකි අනාගතයක් සඳහා එහි මෙහෙයුම් කරගෙන යාමට සමාගමට ප්‍රමාණවත් සම්පත් ඇති බවට සෑහීමට පත්වේ. ඒ අනුව, මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩ පැවැත්ම සංකල්පය මත පදනම් වී පිළියෙල කෙරේ.

2022.12. 31 දිනට ජයා කන්ටේනර් ටර්මිනල් ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩලය පහත පරිදි වේ;

සභාපති	ලක්මාල් රත්නායක මහතා
කළමනාකර අධ්‍යක්ෂ	රංජිත් මලිගස්පේ මහතා
අධ්‍යක්ෂ මණ්ඩලය	1.කේ.ඩී. බර්නාඩ් මහතා 2.ජී යූ කේ අල්ගේවත්තගේ මහතා 3. රොහාන් ද සිල්වා මහතා 4. බී ආර් එල් ගුණවර්ධන මහතා 5.කේ බී හිරාන් ද සිල්වා මහතා

6. කෞශල්‍ය නවරත්න මහතා

7. සී.ඩබ්ලිව්.කේ. ධර්මසේන මහතා - භාණ්ඩාගාර නියෝජිත

අධ්‍යක්ෂ මණ්ඩලය 2022 වසර තුළ රැස්වීම් 12ක් පවත්වන ලදී. අධ්‍යක්ෂ මණ්ඩලයේ අනු කමිටුවක් ලෙස ක්‍රියාත්මක විගණන කමිටුව 2022 වසර තුළ රැස්වීම් 04ක් පවත්වා ඇත. පහත අධ්‍යක්ෂවරු අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ සාමාජිකයින් ලෙස කටයුතු කරයි.

1. එම්.ඒ.එල්.එස්.එන්. මන්ත්‍රීනායක	– භාණ්ඩාගාර නියෝජිත, අධ්‍යක්ෂ (සභාපති)
2. නිරෝෂන් සිරිවර්ධන මහතා	– අධ්‍යක්ෂ – (සාමාජික)
3. ඒ. ප්‍රියන්ත මහතා	– අධ්‍යක්ෂ – (සාමාජික)
4. ඩිල්ෂාන් සිල්වා මහතා	– අධ්‍යක්ෂ – (සාමාජික)
5. එස් හර්මන් ප්‍රනාන්දු මහතා	- අභ්‍යන්තර විගණක - වරාය සහ නාවික අමාත්‍යාංශය

2022 ඔක්තෝබර් සිට විගණන කමිටු සාමාජිකයින් පහත පරිදි වෙනස් වී ඇත.

01. සී.ඩබ්ලිව්.කේ. ධර්මසේන මහතා	- අධ්‍යක්ෂ මණ්ඩල සමාජික (සභාපති)
02. **කේ ඒ ඒ කුලතුංඟ මහතා**	- විගණන අධිකාරී - ජාතික විගණන කාර්යාලය
03. කේ.ඩී. බර්නාඩ් මහතා	- අධ්‍යක්ෂ – (සාමාජික)
04. බී ආර් එල් ගුණවර්ධන මහතා	- අධ්‍යක්ෂ – (සාමාජික)
05. **හිමාලි කමලා විජේරත්න මිය**	- අභ්‍යන්තර විගණක - වරාය සහ නාවික අමාත්‍යාංශය

මෙහෙයුම් /මූල්‍ය කාර්යසාධනය

JCT ලිමිටඩ් 2022 වසර තුළ පැටවුම් මෙට්‍රික් ටොන් 442,305.744 මෙහෙයවූ අතර මෙට්‍රික් ටොන් 421,034.900 මුදා හැරීමේ රාජකාරි සිදුකර ඇත. බිලූමැන්ඩල් ඉන්ධන පර්යන්තයේ සිය ආනයන ඉන්ධන ගබඩා කිරීම සඳහා ගබඩා පහසුකම් ලබාදීමට නැව් තෙල් බලපත්‍රලාභීන් 8 දෙනෙකු සමඟ සමාගම ගිවිසුම්වලට ඇතුළත් වී ඇත.

2022 දී පැටවුම් මෙහෙයුම් 2021 වසරට සාපේක්ෂව 12.73%කින් වැඩි වී ඇත. JCT ලිමිටඩ් කළමනාකරණය විසින් මෙහෙයුම් ධාරිතාවය වැඩි කිරීමට උපායමාර්ග කිහිපයක් ක්‍රියාත්මක කරන ලදී. LSFO 380Cst ගබඩා කිරීමට මෙට්‍රික් ටොන් 3,200ක ධාරිතාවයකින් යුත් නව ටැංකියක් ඉදි කිරීම සම්පූර්ණ කරන ලදී. වරාය අධිකාරිය කොළඹ තෙල් බැංකු පරිශ්‍රය සහ යාබද ප්‍රදේශයේ මෙට්‍රික් ටොන් 12,000 ඉන්ධන ගබඩා ටැංකි පහසුකම් දෙකක් ස්ථාපනය කර ක්‍රියාත්මක කිරීම සඳහා දිගුකාලීන කල්බදු පහසුකම යටතේ ඉඩමෙහි කොටසක් සඳහා ආයෝජකයෙක් තෝරා ගෙන ඇත. 2022 දී JCT ලිමිටඩ් රු. 608,028,143 ක ආදායමක් වාර්තාකළ අතර එය පසුගිය වසරට සාපේක්ෂව 104%ක වැඩිවීමකි.

ප්‍රකාශිත ප්‍රාග්ධනය

2022 දෙසැම්බර් 31 දිනට ප්‍රකාශිත ප්‍රාග්ධනය රු.1,000,000/=කි.

දේපල, පිරියත හා උපකරණ

2022 වසර තුළ දේපල, පිරියත හා උපකරණවල වෙනස්වීම් මූල්‍ය ප්‍රකාශවලට සටහන් 05 හි දක්වා ඇත.

අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික

අධ්‍යක්ෂවරුන් වෙත ගෙවන ලද පාරිශ්‍රමික මූල්‍ය ප්‍රකාශයේ විස්තරාත්මක ආදායම් ප්‍රකාශය තුළ දක්වා ඇත.

ව්‍යවස්ථාපිත ගෙවීම්

අධ්‍යක්ෂවරුන්ගේ උපරිම දැනුම සහ විශ්වාසය පරිදි, රජය සහ සේවකයින් සම්බන්ධයෙන් සියලුම ව්‍යවස්ථාපිත ගෙවීම් මේ දක්වා නිරවුල් කර ඇති බවට හෝ සමාගමේ පොත්වල වෙන් කර ඇති බවට අධ්‍යක්ෂවරුන් සැහීමට පත් වේ.

ශේෂ පත්‍රයෙන් පසු සිදුවීම්

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කළ යුතු ගැලපීම් අවශ්‍යවන සමාගමට සැලකියයුතු බලපෑමක් ඇති කරන කිසිදු වැදගත් සිදුවීමක් ශේෂ පත්‍රයේ දිනයෙන් පසුව සිදුවී නොමැත.

විගණකවරු

ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 19 වැනි සංශෝධනයට අනුව, සමාගම විගණක නිලධාරියෙක් පත් කිරීම අවශ්‍ය ය. විගණකවරුන් වෙත ගෙවූ ගාස්තු මූල්‍ය ප්‍රකාශවලට ඇතුළත් කරන විස්තරාත්මක ආදායම් ප්‍රකාශය තුළ අනාවරණය කෙරේ.

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වසර සඳහා විගණනය ජාතික විගණන කාර්යාලය විසින් සිදු කරන ලදී.

අධ්‍යක්ෂවරුන්ගේ දැනුම අනුව, ඉහත අනාවරණය කළ කරුණු හැර සමාගම සමඟ කිසිදු සම්බන්ධතාවයක් (විගණකවරුන් ලෙස හැර) විගණකවරුන්ට නොමැත. විගණකවරුන්ට සමාගම සමඟ කිසිදු බැඳියාවක් නොමැත. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කළ සදාචාර සංග්‍රහයට අනුකූලව ඔවුන් ස්වාධීන බවට ඔවුන් තහවුරු කරයි.

JCT ලිමිටඩ් හී අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා සහ වෙනුවෙන්.

....

සභාපති කළමනාකාර අධ්‍යක්ෂ

.....

අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

දිනය: 2023.06.15

සභාපතිවරයාගේ පණිවිඩය



ජයා කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ් වෙනුවෙන්, 2022 වසර සඳහා වාර්ෂික වාර්තාවට මෙම පණිවිඩය ඉදිරිපත් කිරීමට ලැබීම මට ඉතාමත් සතුටකි. JCT ලිමිටඩ් ශ්‍රී ලංකා වරාය අධිකාරියට 100%ක් සම්පූර්ණයෙන්ම අයත් පරිපාලිත සමාගමක් වන අතර සමාගමේ ප්‍රධාන කාර්යය වන්නේ කොළඹ වරායේ පිහිටි තෙල් කළමනාකරණය කර ක්‍රියාත්මක කිරීම සහ කලාපය තුළ මුහුදේ ගමන් කරන යාත්‍රා සඳහා ප්‍රමාණවත් ඉන්ධන තොග සහතික කර පවත්වාගෙන යාමයි.

2022 වසර අපගේ සමාගම සඳහා සැලකියයුතු වසරක් වන අතර සමාගම **JCT ලිමිටඩ් ඉතිහාසයේ වඩාත් ඉහළම ලාභය වාර්තා කළ අතර එය රු. මි. 245ක් විය. මෙය 2021 වසරට සාපේක්ෂව ලාභය තුළ 275%ක වැඩි වීමකි. මෙම සම්මානිත ආයතනයේ කළමනාකරණයේ සහ සේවකයින්ගේ කැපවීම සමග ලබාගත් සැලකියයුතු වැඩි වීමකි.**

වසර ආරම්භය මෙට්‍රික් ටොන් 3,200ක ධාරිතාවයකින් යුත් නව නව තෙල් ටැංකි විවෘත කිරීම සමරන ලද අතර එය මාස 11ක වැනි කෙටි කාලයක් තුළ නිම කර අතර අපගේ ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතා සහ ඔවුන්ගේ වුවමනා ඉටුකිරීම පිණිස ධාරිතාව වැඩි කිරීමේ ප්‍රමුඛ අපේක්ෂාව සමඟ කොළඹ තෙල් බැංකුවේ ටැංකි අංගනයට නව එකතු කිරීමකි. අපනයන ක්ෂේත්‍රයේ, සංචාරක ක්ෂේත්‍රයේ, විශේෂයෙන්ම ඇඟලුම් කම්හල්, සංචාරක හෝටල් ආශ්‍රිතව මෙහෙයුම් සජීවීව පවත්වාගෙන යාම සඳහා සමුද්‍ර ගෑස් තෙල් (MGO) සැපයීම සඳහා පාරිභෝගිකයන්ගේ අවසරය සහ අනුමැතිය ලබාගැනීමේ දැවැන්ත ඉන්ධන අර්බුදයක් තුළ නව මෙහෙයුම 2022 වසරේ JCT ලිමිටඩ් හි ආදායම සහ ලාභයට අතිරේකයක් විය.

JCT ලිමිටඩ් වැඩිදුර පුළුල් කිරීම සහ සංවර්ධනයන් සඳහා බන්කර් කර්මාන්තයට අදාළ ක්ෂේත්‍රයන්හී වෙළෙඳපොල විභවතා සහ ඉල්ලුම අඛණ්ඩව සලකා බලා ඇත. එමෙන්ම අපි LSFO සහ MGO භාවිතය සහ සම්ප්‍රදායික නාවික ඉන්ධන වෙනුවට ආදේශක ලෙස භාවිතා කරන LNG සහ Methanol හි හැකියාවන් සම්බන්ධයෙන් අනාගතයේ දී සිදුවිය හැකි වෙළෙඳපොල සංවර්ධනයන් සහ වෙනස්වීම් සම්බන්ධයෙන් අධ්‍යයන සිදු කරමින් පවතී.

ව්‍යාපාරය ශක්තිමත් කිරීමට සහ JCT ආයතනය ලාභදායී ආයතනයක් කිරීමට JCT හි කළමනාකරණ අධ්‍යක්ෂ, අධ්‍යක්ෂ මණ්ඩලය, අංශ ප්‍රධානීන් සහ අනෙකුත් සියලුම කාර්ය මණ්ඩලය විසින් ඉටුකළ අමිල උත්සාහය සහ කැපවීම මම අගය කරමි.

JCT ලිමිටඩ් කළමනාකරණය වෙත ලබාදෙන ලද මහ පෙන්වීම වෙනුවෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති, රනිල් වික්‍රමසිංහ මහතා සහ වරාය, නාවික සහ ගුවන්සේවා අමාත්‍ය, ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා වෙත ස්තුති කිරීමට මම මෙය අවස්ථාව කර ගනිමි.

ලක්මාල් රත්නායක
නීතීඥ
සභාපති- ජයා කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ්

සමාගම හඳුන්වාදීම

අපගේ දැක්ම

ආසියානු කලාපයේ ඉන්ධන පිරවීමේ කේන්ද්‍රය බවට පත්වීම.

අපගේ මෙහෙවර

ඉන්ධන පිරවීමේ බලපත්‍රලාභීන් වෙත යටිතල/ගබඩා පහසුකම් සංවර්ධනය කරමින් රටේ වටිනාකම උපරිම කිරීම.

පරමාර්ථ

- ✓ **නාවික ඉන්ධන තෙල් ගබඩා කිරීම සඳහා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.**
- ✓ **ඉන්ධන පිරවීමේ ව්‍යාපාරයේ කේන්ද්‍රය ලෙස කාර්යක්ෂම හා ඵලදායී ආකාරයකින් කොළඹ තෙල් බැංකුව කළමනාකරණය කිරීම.**
- ✓ **පරිශ්‍රයන්හි ගබඩාකළ නිෂ්පාදනවල ආරක්ෂාව සහතික කිරීම.**
- ✓ **සියළුම සේවකයින් අතර ඉහළ ඵලදායිතා මට්ටමක් වර්ධනය කර පවත්වා ගැනීම.**
- ✓ **මෙහෙයුම්වල සෞඛ්‍ය, ආරක්ෂක සහ පාරිසරික හිතකාමී ක්‍රියාමාර්ග හඳුන්වාදීම.**
- ✓ **ගනුදෙනුකරුවන්ට කාර්යක්ෂම හා ඵලදායී සේවා ලබාදීම.**

සමාගම හඳුන්වාදීම

කොළඹ තෙල් බැංකුව ලෙසින් ද හඳුන්වනු ලබන, ජයා කන්ටේනර් ටර්මිනල් සමාගම (JCT සමාගම), ශ්‍රී ලංකා වරාය අධිකාරියට සම්පූර්ණයෙන්ම අයත් පරිපාලිත සමාගමක් වන අතර, එය කලාපය තුළ ප්‍රමුඛ ඉන්ධන පිරවීමේ ගබඩා ආයතනය ද වේ. ජය කන්ටේනර් ටර්මිනල් සමාගම (PB 960) 2002 පෙබරවාරි 21 දින 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ සංස්ථාපිත කරන ලද අතර ශ්‍රී ලංකා වරාය අධිකාරියට 100%ක් සම්පූර්ණයෙන් අයිති සමාගමක් වශයෙන් 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ 2008 අප්‍රේල් 25 දින ලියාපදිංචි කරන ලදී.

2008 වසර තුළ, ජයා කන්ටේනර් ටර්මිනල් සමාගම වෙත ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් කොළඹ 15, වෝල්ස් පටුමගේ අංක 69 හි කොළඹ තෙල් බැංකුව කළමනාකරණය කිරීම සහ පාලනය කිරීම පවරන ලදී. සමාගමේ ප්‍රධාන කාර්යය වන්නේ එකී තෙල් බැංකුව කළමනාකරණය කර පාලනය කිරීම වන අතර, එය ආනයනය කළ ඉන්ධන ගබඩා කිරීම සඳහා ඉන්ධන සැපයීමේ බලපත්‍රලාභීන් (BLHs) වෙත පහසුකම් සැපයීමට ශ්‍රී ලංකා රේගුවේ අනුමත බන්ධිත ගුදමක් ලෙස ස්ථාපිත කරන ලදී.

JCT සමාගමේ මූලික ව්‍යාපාරය වන්නේ යාත්‍රා සඳහා සැපයීමට නාවික ඉන්ධන ගබඩා කිරීම සහ මුහුදේ යාත්‍රා සඳහා ඉන්ධන සපයන සමාගම්වලට අවශ්‍ය කරන ඉන්ධන ලබාදීමයි. අඩු සල්ෆර් ඉන්ධන තෙල් (LSFO) සහ නාවික ගෑස් තෙල් (MGO) යන ඉන්ධන කාණ්ඩවලට අයත් නාවික ඉන්ධන එකී පරිශ්‍රයේ දැනට ගබඩා කර ඇති අතර, මීට පෙර 2019 දක්වා බර ඉන්ධන තෙල් (HFO) 380 සහ අතරමැදි ඉන්ධන තෙල් (IFO) 180 ගබඩා කරන ලදී. වර්තමානයේ, නාවික ඉන්ධන තෙල් මෙට්‍රික් ටොන් 38,200 ක ධාරිතාවයක් ගබඩා කිරීම සඳහා ඉන්ධන ටැංකි 14 ක් සමාගම සතුව පවතී. ඉහත පහසුකම් කොළඹ 15 හි බිලූමැන්ඩල් ප්‍රදේශයේ අක්කර 9 ක භූමි ප්‍රමාණයක පිහිටා ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලය

2022.12.31 දිනට ජයා කන්ටේනර් ටර්මිනල් ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩලය පහත පරිදි වේ;

සභාපති	ලක්මාල් රත්නායක මහතා
කළමනාකර අධ්‍යක්ෂ	රංජිත් මලිගස්පේ මහතා
අධ්‍යක්ෂ මණ්ඩලය	1.කේ.ඩී. බර්නාඩ් මහතා 2.ජී යූ කේ අල්ගෙවත්තගේ මහතා 3. රොහාන් ද සිල්වා මහතා 4. බී ආර් එල් ගුණවර්ධන මහතා 5.කේ බී හිරාන් ද සිල්වා මහතා 6. කෞශල්‍ය නවරත්න මහතා 7. සී.ඩබ්ලිව්.කේ. ධර්මසේන මහතා - භාණ්ඩාගාර නියෝජිත

කළමනාකරණ කණ්ඩායම

1. ලෝරින් ද සිල්වා

නීති හා මානව සම්පත් ප්‍රධානී/අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

ලොරින් ද සිල්වා මහත්මිය 2009 දී ජය කන්ටේනර් ටර්මිනල් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නීති නිලධාරි / ලේකම් ලෙස JCT සමාගම හා සම්බන්ධ විය. ඇය වෘත්තියෙන් නීතිඥවරියක් වන අතර, කොළඹ විශ්ව විද්‍යාලයේ නීති පීඨයේ උපාධිධාරිනියකි. ඇය නීතිය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් සහ කොළඹ විශ්ව විද්‍යාලයෙන් මානව සම්පත් පිළිබඳ පශ්චාත් උපාධියක් ද ලබා ඇත. JCT සමාගමට බැඳීමට පෙර ඇය මානව හිමිකම් හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ සහ ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කොමිෂන් සභාවේ සේවය කළාය. ඇය 2016 දී මානව සම්පත් හා නීති අංශ ප්‍රධානී ලෙස උසස් කරන ලදී.

2. සුගන්දිකා එම් ලන්සකාර

මූල්‍ය ප්‍රධානී

සුගන්ධිකා ලන්සකාර මහත්මිය 2009 ජූලි මාසයේදී ගණකාධිකාරී ලෙස JCT සමාගමට බැඳුණි. ඇය කළමනාකරණ ගණකාධිකාරීවරියක් වන අතර වරලත් කළමනාකරණ ගණකාධිකාරීන්ගේ ආයතනයේ (ACMA) සහය සාමාජිකාවකි. ඇය ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් මූල්‍ය (විශේෂ) විද්‍යාවේදී උපාධියක් ලබාගෙන ඇත. ඇය 2012 වසරේදී මුදල් ප්‍රධානී තනතුරට උසස් කරන ලදී.

3. නලින් විතානපතිරණ

ඉංජිනේරු ප්‍රධානී

නලින් විතානපතිරණ මහතා 2010 පෙබරවාරි මාසයේදී JCT සමාගම වෙත යාන්ත්‍රික ඉංජිනේරු ලෙස සම්බන්ධ වී ඇත. ඔහු යාන්ත්‍රික ඉංජිනේරුවරයෙක් වන අතර, ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ (IESL) සහකාර සාමාජිකයෙකි. ඔහු පේරාදෙනිය විශ්ව විද්‍යාලයෙන් යාන්ත්‍රික ඉංජිනේරු ක්ෂේත්‍රය තුළ විද්‍යාවේදී උපාධියක් ලබා ගෙන ඇත. ඔහු 2012 වසරේ ඉංජිනේරු ප්‍රධානී තනතුරට උසස් කරන ලදී.

4. නලින්ද රාජසිංහ

ව්‍යාපාර සංවර්ධන හා මෙහෙයුම් ප්‍රධානී

නලින්ද රාජසිංහ මහතා 2010 ජූනි මාසයේදී JCT සමාගමේ මෙහෙයුම් හා ව්‍යාපාර සංවර්ධන ප්‍රධානියා ලෙස සම්බන්ධ වී ඇත. ඔහු කොළඹ විශ්ව විද්‍යාලයේ ආචාර්ය උපාධිය හදාරමින් සිටින අතර ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් MBA (ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති) උපාධියක් ලබාගෙන ඇත. එමෙන්ම ඔහු කොළඹ විශ්ව විද්‍යාලයෙන් කළමනාකරණ උපාධියක් (ව්‍යාපාර පරිපාලනවේදී උපාධිය) ද ලබාගෙන ඇත.

අංශමය කාර්යසාධනය

1. මෙහෙයුම් අංශය

අදාළ ගාස්තු ගෙවීමට යටත්ව, ඉන්ධන පිරවුම් බලපත්‍ර දරන්නන් විසින් කොළඹ වරාය හරහා කොළඹ තෙල් බැංකුවට නාවික ඉන්ධන ආනයනය කර මුදා හරිනු ලැබේ. JCT සමාගම විසින් පරිශීලකයා විසින් ආනයනය කරන ලද තෙල් ටැංකි වෙත ගොඩ බෑමට සහ එම තෙල් නැවත බත්තල් මත පැටවීම සඳහා ගබඩා පහසුකම් සහ පොම්ප කිරීමේ පහසුකම් සපයනු ඇත. මේ වන විට කොළඹ තෙල් බැංකුව සමඟ ක්‍රියාත්මක වන ඉන්ධන පිරවුම් බලපත්‍රලාභීන් අට දෙනෙක් (8) සිටී. පහත සඳහන් නිෂ්පාදන JCT සමාගමේ ඉන්ධන ටැංකිවල ගබඩා කරනු ලබයි.

- අඩු සල්ෆර් ඉන්ධන තෙල් (LSFO) 380 Cst
- සමුද්‍රීය ඩීසල් (MGO)

2020 පැටවීම් දත්ත විශ්ලේෂණය කිරීම

2020 වසර සඳහා පැටවීම් විශ්ලේෂණ පහත වගුව සහ රූප සටහන මඟින් පෙන්නුම් කරයි.

නිෂ්පාදිතය	2020 පැටවීම් (මෙ.ටො.)
HFO 380 Cst	263.795
LSFO 380 Cst	294,550.843
MGO	83,726.283



ඉහත වගුව සහ රූපසටහන අනුව, LSFO 380 Cst නිෂ්පාදනය මුළු පැටවුම් ප්‍රමාණයෙන් 78%ක් නියෝජනය කරන අතර, MGO සහ HFO 380 Cst පිළිවෙලින් 22% සහ 0% බවට පත්ව ඇත.

2021 පැටවීම් දත්ත විශ්ලේෂණය කිරීම

2021 වසර සඳහා පැටවීම් විශ්ලේෂණ පහත වගුව සහ රූප සටහන මඟින් පෙන්නුම් කරයි.

නිෂ්පාදිතය	2021 පැටවීම් (මෙ.ටො.)
HFO 380 Cst	740.541
LSFO 380 Cst	329,633.159

MGO	61,975.947



ඉහත වගුව සහ රූපසටහන අනුව, LSFO 380 Cst නිෂ්පාදනය මුළු පැටවුම් ප්‍රමාණයෙන් 84%ක් නියෝජනය කරන අතර, MGO සහ HFO 380 Cst පිළිවෙලින් 16% සහ 0% බවට පත්ව ඇත.

2022 පැටවීම් දත්ත විශ්ලේෂණය කිරීම

2022 වසර සඳහා පැටවීම් විශ්ලේෂණ පහත වගුව සහ රූප සටහන මඟින් පෙන්නුම් කරයි.

නිෂ්පාදිතය	**2022 පැටවීම් (මෙ.ටො.)**
LSFO 380 Cst	353,502.598
MGO	88,803.146



2022 දී ඉහත වගුව /රූපසටහන අනුව,LSFO 380 Cst නිෂ්පාදනය මුළු පැටවුම් ප්‍රමාණයෙන් 84%ක් නියෝජනය කරන අතර, MGO 20% බවට පත්ව ඇත.

පැටවුම් සන්සන්දනය කිරීම:

විස්තරය	2020 (මෙ.ටො.)	2021 (මෙ.ටො.)	2022 (මෙ.ටො.)
HFO380 Cst	263.795	740.541	-
LSFO 380 Cst	294,550.843	329,633.159	353,502.598
MGO	83,726.283	61,975.947	88,803.146
TOTAL	**378,540.921**	**392,349.647**	**442,305.744**



2020 සිට 2022 දක්වා පැටවුම් දත්ත විශ්ලේෂණය කිරීම තුළින්, සියලුම නිෂ්පාදනවල පැටවීමේ ප්‍රධාන වෙනස්වීම් සහ මෙහෙයුම්වල කාර්යසාධනය හඳුනා ගත හැකිය. 2020 දක්වා පැටවුම් දත්ත අනුව, LSFO හි මුළු පැටවීම මෙට්‍රික් ටොන් 294,550.843 ක් වූ අතර MGO මුළු පැටවීම මෙට්‍රික් ටොන් 83,726.283 කි නමුත් 2021 දී LSFO 380Cst මුළු පැටවුම් ප්‍රමාණය 2020 වර්ෂයට වඩා මෙට්‍රික් ටොන් 35,082.316 වැඩි වී ඇති අතර එය 2021 වර්ෂයට වඩා මෙට්‍රික් ටොන් 23,869.439 කින් 2022 වර්ෂයේ දී වැඩි වී ඇත.

2020 දී MGO මුළු පැටවීම මෙට්‍රික් ටොන් 83,726.283 ක් වූ අතර එය 2021ට වඩා මෙට්‍රික් ටොන් 21,750.336 කින් අඩුවීමකි. 2021 දී MGO මුළු පැටවීම මෙට්‍රික් ටොන් 61,975.947 ක් වූ අතර එය 2022 දී මෙට්‍රික් ටොන් 88,803.146 කි. එය 2021 ට වඩා 43.28%ක වැඩි වීමකි. මෙම තත්ත්වයට ප්‍රධාන හේතුව වනනේ රටතුළ වර්තමාන ඉන්ධන අර්බුදය යටතේ දේශීය අපනයනකරුවන්ට සහ විදුලි උත්පාදන සමාගම්වලට ඉන්ධන සැපයීම සඳහා පුද්ගලික අංශය ලෙස නැව් තෙල් බලපත්‍රලාභීන් සඳහා අවසර දීමට රජය විසින් ගනු ලබන තීරණයයි.



2022 දී ටැංකි ට්‍රක් මඟින් ගෘහස්ථ ඉන්ධන සැපයීම

රජය විසින් ගනු ලබන තීරණයට අනුව, රටතුළ ඉන්ධන අර්බුද කාලය තුළ, JCT ලිමිටඩ් හි ටැංකි ට්‍රක් යොදා ගෙන දේශීය අපනයනකරුවන්ට සහ විදුලි උත්පාදන සමාගම්වලට සපයන ලද මෙට්‍රික් ටොන් ප්‍රමාණය පහත පරිදි වේ;

මාසය	LSFO (Mt)	MGO (Mt)	TOTAL (Mt)
අප්‍රේල්	124.140	1,487.848	1,611.988
මැයි	800.757	2,922.038	3,722.795
ජූනි	2,032.117	4,836.262	6,868.379
ජූලි	1,442.125	9,501.068	10,943.193
අගෝස්තු	2,480.490	7,881.792	10,362.282
සැප්තැම්බර්	3,199.365	4,631.140	7,830.505
ඔක්තෝබර්	2,112.290	3,265.372	5,377.662
නොවැම්බර්	1,043.227	2,972.348	4,015.575
දෙසැම්බර්	751.707	2,894.038	3,645.745
එකතුව	**13,986.218**	**40,391.906**	**54,378.123**

2. මූල්‍ය අංශය - මූල්‍ය සමාලෝචනය

2022 මූල්‍ය වසර නියාමන වෙනස්වීම් බලාත්මක කළ බොහෝ අභියෝග සහිත වසරක් විය. JCT ලිමිටඩ් 2022 වසර තුළ මේ දක්වා එහි පළමු ඉහළම ලාභය සාක්ෂාත් කර ගෙන ඇත. ආදායම රු.මි. 298 සිට රු.මි 608 දක්වා වැඩිවූ එය 104% ක වැඩිවීමකි. ලාභයද රු.මි. 65 සිට රු.මි .245.6 දක්වා වැඩි වූ අතර එය 275% ක වැඩිවීමකි. ආදායම වැඩි වීම සඳහා ප්‍රධාන හේතුව විනිමය අනුපාත උච්චාවචනය, බවුසර් යොදාගෙන දේශීය වෙළෙපොල සඳහා ඉන්ධන සැපයීම සහ HSFO 380Cst ඉන්ධන සඳහා පාවෙන ගබඩා පහසුකම් සැපයීම මෙයට හේතු විය. 2021 වසර සඳහා පැටවීම මෙට්ට්‍රික් ටොන් 392,350 ක් වූ අතර 2022 වසරේදී එය මෙට්ට්‍රික් ටොන් 442,305 දක්වා වැඩි වී ඇත. 2021 වසර හා සැසැඳීමෙදී එය 11.29%ක වැඩිවීමකි.

JCT ලිමිඩට් 2022 වසර තුළ රු.මිලියන 325ක බදු පෙර ලාභයක් වාර්තා කර ඇත. මූල්‍ය අදායම රු. මිලියන 49ක් වූ අතර 2021ට සාපේක්ෂව 187% ක වැඩි වීමකි. අදායම් බදු අනුපාතවල වැඩි වීම හේතුවෙන්, ආදායම් බදු වියදම් රු.මි. 79.5 දක්වා වැඩි වී ඇත. ආදායම් බදු අනුපාත 14% සිට 30% දක්වා වැඩි කරන ලදී. සමාගමේ රඳවාගත් ඉපයීම් රු.මි. 462 සිට රු.මි. 681 දක්වා වැඩි විය. 2022 වසර තුළ සමාගම විසින් අත්කර ගත් හිතකර මූල්‍ය තත්ත්වයක් පවතී.

2021 වසර සහ 2022 වසරවල ප්‍රධාන මූල්‍ය දත්තවල සැසැඳීම පහත ප්‍රස්ථාරයෙන් පෙන්වා දේ.



පසුගිය වසර තුළ සමාගමේ මූල්‍ය ප්‍රගතිය පහත වගුවෙන් පෙන්නුම් කෙරේ.

වසර	2018	2019	2020	2021	2022
ආදායම	287,571,286	283,793,238	210,560,557	297,763,569	608,028,143
දළ ලාභය	144,242,855	138,245,036	87,521,475	163,978,255	415,846,116
මෙහෙයුම් ලාභය	63,304,163	54,545,170	-1,695,868	63,858,028	289,387,021
ශුද්ධ ලාභය	91,294,628	92,885,648	1,2595,879	65,452,487	245,611,516



JCT ලිමිටඩ් 2022 වසර සඳහා රු.මිලියන 608.02ක් වන ආදායමක් වාර්තා කළ අතර 2022 වසර සඳහා රු.මිලියන 325.12ක බදු පෙර ලාභයක් වාර්තා කර ඇත. මූල්‍ය ආදායම රු.මිලියන 49.48ක් වූ අතර එයට 2021 වසර හා සාපේක්ෂව 187%ක වැඩි වීමකි. JCT ලිමිටඩ් හි, ස්ථාවර තැන්පතු 2022 දී රු.මි. 263 සිට රු.මි. 521 දක්වා වැඩි වී ඇත. එමෙන්ම සමාගමේ රඳවාගත් ඉපයීම් රු.මි. 462.05 සිට රු.මි. 680.78 දක්වා වැඩි වී ඇත. 2022 වසර තුළ සමාගමේ ශුද්ධ ලාභය රු. මිලියන 245.61ක් වූ අතර එය 2021 වසරට සාපේක්ෂව 275%ක වැඩි වීමකි. එමෙන්ම කොටසක ඉපයීම 654.52 සිට 2456.12 දක්වා වැඩි වී ඇත.

පහත අනුපාත විශ්ලේෂණයෙන් 2021 හා 2022 වසර තුළ සමාගමේ මූල්‍ය තත්ත්වයෙහි හිතකර තත්ත්වය පෙන්නුම් කරයි.

		2021	2022
1.	දළ ලාභ ආන්තිකය	55.07%	68.39%
2.	ශුද්ධ ලාභ ආන්තිකය	21.98%	40.39%
3.	යොදවන ලද ප්‍රාග්ධනය මත ඉපයීම්	14%	41%
4.	වර්තන අනුපාතය	9:1	4:1
5.	තෝලනය	23.3%	39.95%
6.	කොටසකට ඉපයීම්	654.52	2456.12

3. ඉංජිනේරු අංශය

ඉංජිනේරු අංශයේ ප්‍රධාන වගකීම වන්නේ එන්ජින් පොම්ප, ඉන්ධන ගබඩා ටැංකි, බොයිලේරු, ඉන්ධන බෙදා හැරීමේ නළ මාර්ග, ගොඩනැගිලි, වාහන සහ වෙනත් යන්ත්‍රෝපකරණ සහ උපකරණ සඳහා විධිමත් නඩත්තු වැඩසටහන් සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීමයි. ඊට අමතරව, සියලු පිරිසැකසුම් කටයුතු, සිවිල් ඉංජිනේරු සහ විදුලි ඉංජිනේරු කටයුතු, ඉන්ධන පර්යන්තයේ ගිනි හා ආරක්ෂාව සහ අංගන නඩත්තු කටයුතු ආදිය සඳහා ද ඉංජිනේරු අංශය වගකීමට බැඳී සිටී.

2021 - 2022 කාලසීමාව තුළ සිදු කරන ලද ප්‍රධාන ව්‍යාපෘති

(අ.) මෙට්‍රික් ටොන් 3200 ක ධාරිතාවයකින් යුත් ඉන්ධන ගබඩා ටැංකියක් ඉදිකිරීම

අඩු සල්ෆර් නාවික ඉන්ධන සැපයීම සඳහා මෙට්‍රික් ටොන් 3200 ක ධාරිතාවයකින් යුත් ඉන්ධන ගබඩා ටැංකියක් ඉදිකිරීමට තීරණයක් ගෙන තිබුණි. පිරිසැකසුම් කිරීමේ කටයුතු 2020 ඔක්තෝබර් මාසයේ ආරම්භ කරන ලද අතර, 2021 දෙසැම්බර් මාසයේ දී නිම කරන ලදී. COVID-19 වසංගතය නිසා රජය විසින් හදිසියේ ඇඳිරි නීතිය පැනවීම සහ වරින් වර 2020 වසරේ ඔක්තෝබර් - දෙසැම්බර් කාලසීමාව තුළ අදාළ ප්‍රදේශය හුදකලා කිරීම හේතුවෙන් ව්‍යාපෘතිය නිම කිරීම ප්‍රමාද විය. ටෙන්ඩර් ලියකියවිලි කටයුතු ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් මෙහෙයවන ලද අතර, සමස්ත ව්‍යාපෘති පිරිවැය රු. මිලියන 100 කි. ඒ සඳහා JCT සමාගම විසින් අදාළ සම්පූර්ණ පිරිවැය දරන ලදී.



(ආ) කොළඹ වරායේ නව නැංගුරම් පහසුකම් නිර්මාණය

කොළඹ වරායේ මුළු ඉන්ධන පිරවුම් වෙළෙඳපොල මාසයකට මො.ටො. 55,000 – 60,000 අතර සාමාන්‍යයක පවතී. JCT සමාගමේ ලියාපදිංචි ඉන්ධන පිරවුම් බලපත්‍රලාභීන් (BLH) කොළඹ වරායේ වෙනම ඉන්ධන පිරවුම් නැංගුරම් ජැටියක්/අවකාශයක් වෙන් කර දෙන මෙන් දිගින දිගටම ඉල්ලීම් සිදුකර ඇත. එයට හේතුව, නව උතුරු ජැටිය (NNP) අදාල නෞකා සඳහා නැංගුරම් ඉඩ පහසුකම් සපයන තුරු ඔවුන්ගේ ඉන්ධන තොග පටවන නැව්වලට වරායෙන් පිටත රැඳි සිටීමට සිදුවීමයි. එමෙන්ම JCT සමාගමේ ලියාපදිංචි ඉන්ධන පිරවුම් බලපත්‍රලාභීන් බත්තල පැටවීම සඳහා ද ඉඩකඩ ඉල්ලා ඇති අතර, එයට හේතුව දකුණු ජැටියේදී වඩා ඉහළ බත්තල් නැංගුරම් දැමීමට පහසුකම් නොමැති වීමයි. ඉහත කරුණු සලකා බලමින්, පැටවීම සහ මෙහෙයුම් මුදාහැරීමේ අරමුණ සඳහා කොළඹ වරායේ UCT පර්යන්තය දක්වා දකුණු ජැටියේ ඉන්ධන පොම්ප මාර්ග දීර්ඝ කිරීම සඳහා

2021 වසරේදී ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් මූලික පියවර ගෙන ඇත. UCT හි පොම්ප එලීම සහ ජැටි 02ක් නිර්මාණ වැඩ 2022 වසරේ අවසන් කරන ලදී.



(ඇ) <u>මෙට්‍රික් ටොන් 12000 ක ධාරිතාවයකින් යුත් ටැංකි දෙකක් ඉදිකිරීම</u>

කොළඹ වරායේ මුළු ඉන්ධන පිරවුම් වෙළෙඳපොල පරිමාව මාසයකට මෝ.ටෝ. 55,000 – 60,000 අතර සාමාන්‍යයක පවතී. JCT සමාගමේ ලියාපදිංචි ඉන්ධන පිරවුම් බලපත්‍රලාභීන් කොළඹ ඉන්ධන බැංකුවේ ගබඩා ධාරිතාව වැඩි කරන මෙන් දිගින් දිගට ඉල්ලීම් සිදුකර ඇත.

ඉදිරි වසර පහ තුළ අනාගත පුරෝකථන ඉල්ලීම් සැලකිල්ලට ගනිමින්, JCT සමාගමේ සහ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ නිලධාරීන්ගෙන් සමන්විත තාක්ෂණික කමිටුවක් නම් කිරීමට සහ එකී කමිටුව තුළින් අවශ්‍ය කාර්යයන් කරගෙන යාමට 2020 සැප්තැම්බර් 18 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී තීරණයක් ගනු ලැබීය. ඒ අනුව, කමිටුව මඟින් මෙ.ටෝ.12000ක ධාරිතාවයකින් යුත් ටැංකි දෙකක් ඉදිකිරීමට ඉඩම් ප්‍රදේශයක් හඳුනාගෙන ඇති අතර පස් විමර්ෂණ පරීක්ෂණය හඳුනාගත් ඉඩම් ප්‍රදේශය තුළ සිදුකරන ලදි. ඛණිජ තෙල් නීතිගත සංස්ථාව (CPC), ලංකා විදුලිබල මණ්ඩලය (CEB), මාර්ග සංවර්ධන අධිකාරිය (RDA), අරක්ෂක අමාත්‍යාංශය, සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය (MEPA), ජාතික ජලප්‍රවාහන සහ ජල සම්පාදන මණ්ඩලය (NWS & DB), කොළඹ මහ නගර සභාවේ ගිනි දෙපාර්තමේන්තුව හා වැසි ජලය සහ මධ්‍යම පරිසර අධිකාරිය (CEA) නිෂ්කාෂණ ලබාගන්නා ලද අතර ඉදිකිරීම් වැඩ ආරම්භ කිරීමට පෙර සංවර්ධන අවසරය ලබා ගැනීමට නාගරික සංවර්ධන අධිකාරිය (UDA) වෙත මාර්ගගත අයදුම්පතක් ඉදිරිපත් කරන ලදී.

ශ්‍රී ලංකා වරාය අධිකාරිය ඉහත වැඩසටහන යටතේ කොළඹ තෙල් බැංකු පරිශ්‍රය හා ආසන්න ප්‍රදේශයේ ඉන්ධන ගබඩා ටැංකි/පහසුකම් ස්ථාපිත කිරීම සහ මෙහෙයුම් සඳහා ඉඩම් සඳහා දිගුකාලීන බදු සඳහා ආයෝජකයින් තෝරා ගැනීමට පියවර ගෙන ඇත.

සී/ස කොරල් එනර්ජි ඩීඑම් සීසී සහ සී/ස එස් ඒ බී සී සී ෆිනික්ස් සිපින් (ප්‍රටිවට්) ලිමිටඩ් එක්ව SLPA විසින් 2022.10.21 දිනැති ලංසු ආරාධනයට ප්‍රතිචාරාත්මකව 2022.12.16 දින තාක්ෂණික හා මූල්‍ය යෝජනාවක් ඉදිරිපත් කරන ලදී. සාර්ථක ලංසු වට සහ සාකච්ඡා මත, SLPA විසින් සාර්ථක ලංසුකරු ලෙස කොන්සොර්ටියම් තෝරා ගන්නා ලදී.

ඒ අනුව, SLPA හි අධ්‍යක්ෂ මණ්ඩලය වසර 32 ක දිගුකාලීන බදු පදනම මත කොළඹ තෙල් බෑංකු බෑංකු පරිශ්‍රය තුළ මෙ.ටො.12000 ධාරිතාවයෙන් යුත් ඉන්ධන ගබඩා ටැංකි/පහසුකම ස්ථාපිත ක්‍රියාත්මක කිරීම සඳහා හවුල් ව්‍යාපාරයකට ප්‍රදාන ලිපිය නිකුත් කරන ලදී.

බිල්ලැමැන්ඩල් තෙල් පර්යන්තයේ ගිනි සහ ආරක්ෂාව .

1. ගිනි පෙරහුරු අභ්‍යාසය

- ශ්‍රී ලංකා වරාය අධිකාරිය, කොළඹ මහනගර සභාව සහ JCT සමාගමේ ගිනි හා ආරක්ෂක නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් 2022 වසර තුළ සාර්ථක ඒකාබද්ධ ගිනි පෙරහුරු පවත්වන ලදී.



2. උසස් තත්වයේ ගිනි හා ප්‍රථමාධාර පුහුණු වැඩසටහන

ශාන්ත ජෝන් ගිලන්රථ සංගමය සහ කොළඹ මහනගර සභාවේ ගිනි හා ආරක්ෂක පුහුණු ආයතනය මගින් උසස් ගිනි හා ප්‍රථමාධාර පුහුණු වැඩසටහන පැවැත්වීමට පියවර ගෙන ඇත.





4. නීති සහ මානව සම්පත් අංශය

ජයා කන්ටේනර් ටර්මිනල්ස් සමාගමේ සේවකයින්ගේ ජීවන චක්‍රය තුළ කළමනාකරණ මණ්ඩලය ලෙස නීති හා මානව සම්පත් අංශය නව ප්‍රවණතා හා තාක්ෂණයන්ට අනුගත වන ආයතනික අරමුණු හා පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා තම කණ්ඩායම් සාමාජිකයින් ඵලදායී හා කාර්යක්ෂමව යොදා ගනිමින් එහි උපරිම ධාරිතාවයෙන් කටයුතු කිරීමට කැපවී සිටී.

මානව සම්පත

මෙම අංශය 2022.12.31 දිනට අංශ ප්‍රධානී, විධායක, පුද්ගලික ලේකම්වරුන් **1** ක්, ලිපිකරුවන් 3 ක්, කළමනාකරණ සහකාර 01ක් සහ කාර්යාල සහයකයින් **7** කින් සමන්විත විය. කාර්ය මණ්ඩලය බඳවා ගැනීම හා කුලියට ගැනීම, සමාගමේ බඳවා ගැනීම් සහ ආයතනික උපාය මාර්ග සංවර්ධනය කිරීම, ප්‍රතිලාභ සහ වන්දි අධීක්ෂණය හා කළමනාකරණය, ගැටුම් මෙහෙයවීම, ආයතනික සන්නිවේදනය කළමනාකරණය කිරීම සහ වැඩිදියුණු කිරීම, විනය ක්‍රියාමාර්ග සහ සේවය අවසන් කිරීම්, සේවක කාර්යසාධනය නිරීක්ෂණය කිරීම, ආයතනික සංස්කෘතිය කළමනාකරණය, පැමිණීමේ හා නිවාඩු පිළිබඳ වාර්තා තබා ගැනීම, වැටුප් පිළියෙල කිරීම සඳහා මූල්‍ය අංශයට නියමිත වේලාවට වාර්තා සැපයීම, ආරක්ෂිත හා සියලු දෙනා ඇතුළත් වැඩ පරිසරයක් නිර්මාණය කිරීම, සේවකයින්ගේ සුභසාධන පහසුකම් ආරම්භ කිරීම, සේ.අ.අ / සේ.නි.හා.අ. සඳහා ලියකියවිලි සකස් කිරීම, කාර්ය මණ්ඩල පුහුණුව සංවිධානය කිරීම, නීතිමය කටයුතු සහ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් කටයුතු හැසිරවීම යනාදිය මෙම අංශයේ ප්‍රධාන කාර්යයන් වේ. 2022.12.31 දිනට සමාගමේ මුළු ශ්‍රම බලකාය කොන්ත්‍රාත් සේවකයින් 13 ක් ද ඇතුළුව සේවකයින් 104 ක් වූ අතර, සේවකයින් 01 ක් විශ්‍රාම ගත් අතර ඉල්ලා අස්වීම් 04ක් සහ කොන්ත්‍රාත් රැකියා අවසන් කිරීම් 01ක් විය.

වන්දි සහ ප්‍රතිලාභ

JCT සමාගමේ සේවකයින්ට රු .200,000/- දක්වා උපරිම වශයෙන් රෝහල්ගතව ප්‍රතිකාර සඳහා වෛද්‍ය ආධාර යෝජනා ක්‍රමය යටතේ පවුලේ වෙනත් සාමාජිකයින් 03 දෙනෙකුට ප්‍රතිලාභ ලබා දෙන අභ්‍යන්තර වෛද්‍ය ආධාරයක් ලබා ගැනීමට වරප්‍රසාද හිමිවේ. 2022 වර්ෂය තුළ රෝහල්ගතව ප්‍රතිකාර ලබා ගත් සේවකයින්ගේ වියදම රුපියල් 2,940,555.15 ක් විය. ඊට අමතරව වෛද්‍ය ප්‍රතිකාර ප්‍රතිපූරණය කිරීම සඳහා රු. 691,652.73 ක් ද, වෛද්‍ය පරීක්ෂණ ප්‍රතිපූරණය කිරීම සඳහා රු. 372,888.50ක් ද, ඇස් කණ්ණාඩි සඳහා රු .45,000.00 ක් ද ගෙවා ඇත. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වෛද්‍ය මධ්‍යස්ථානයෙන් ප්‍රතිකාර ලබා ගැනීමට සේවකයින්ට අවසර දී ඇති අතර, බිලූමැන්ඩල් පර්යන්තයේ සිට ශ්‍රී ලංකා වරාය අධිකාරිය දක්වා ප්‍රවාහන පහසුකම් සපයනු ලැබේ. ඒ අනුව 2022 වර්ෂය තුළ සේවකයින් සඳහා වෛද්‍ය පහසුකම් සැපයීම වෙනුවෙන් රු. 1,029,647.86 ක් වැය වී තිබේ.

සමාගමේ සියලුම සේවකයින් පැය 24 ක පුද්ගලික අනතුරු රක්ෂණ ආවරණයකින් ආවරණය වන අතර, කම්කරු වන්දි පනත යටතේ මේ දක්වා කිසිදු හිමිකම් පෑමක් කර නොමැත.

සේවකයින් විසින් සිදුකළ ඉල්ලීම සැලකිල්ලට ගනිමින්, 2018 වර්ෂයේදී ලංකා බැංකුවේ පහසුකම් සහිතව රුපියල් මිලියන 2 ක් දක්වා නිවාස ණය පහසුකමක් හඳුන්වා දුන් අතර 2022 වසර දක්වා ක්‍රියාත්මක විය. මෙම වැඩසටහන යටතේ 2018 සිට 2022 දක්වා සේවකයින් 08 දෙනෙකුට එම ණය මුදල ලබා දී ඇත. ඊට අමතරව ආපදා ණය (මාස 10 වැටුප), රු.500,000.00 බහුකාර්ය ණය සහ රු.10,000.00 සහ රු.5,000 අලුත් අවුරුදු ණය පිළිවෙලින් රු.4.2% සහ 10% පොලී අනුපාතයට ලබා දී ඇත.

මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය යටතේ, සේවකයෙකු / පියා / මව / මාමා / නැන්දාගේ මරණයක් සඳහා රුපියල් 170,000 ක මුදලක් ගෙවනු ලැබේ. එමෙන්ම විශ්ව විද්‍යාල ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ සියලුම ස්ථිර සේවකයින්ගේ දරුවන්ට මූල්‍ය ආධාර ලබා ගත හැකිය.

පුහුණුවීම

COVID 19 වසංගත සෞඛ්‍ය මාර්ගෝපදේශ පිළිපදිමින් නීති හා මානව සම්පත් අංශය 2022 වර්ෂය තුළ සේවකයින් සඳහා පුහුණු වැඩසටහන් කිහිපයක් සංවිධානය කරන ලදී. ආසන්න වශයෙන් සේවකයින් 50 ක් මෙම වැඩසටහන්වලට සහභාගි වූ අතර, ඵලදායී ආකාරයකින් සමාගම වෙනුවෙන් ඔවුන්ගේ විශිෂ්ට යෙදවුම ලබාදීම සහතික කිරීම සඳහා කාර්ය මණ්ඩලය දිරිගැන්වීමට සහ ධෛර්යමත් කිරීමට අපට හැකි වී ඇත. නීති හා මානව සම්පත් අංශය ඉදිරියේදී වැඩිපුර පුහුණු සැසි පැවැත්වීමට බලාපොරොත්තු වේ.

වැටුප් ලේඛනය

සමාගමේ මාසික වැටුප් ගෙවීම සකස් කර සහ ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ සියලුම වාර්තා හා විස්තර නිවැරදිව කාලෝචිත ආකාරයකින් මූල්‍ය අංශය වෙත ඉදිරිපත් කරනු ලැබේ.

නීති / අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

නෛතික කාර්යයන් සම්බන්ධයෙන්, නීති හා මානව සම්පත් ප්‍රධානී /අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ නීති අංශය සමඟ සම්බන්ධීකරණය කරයි. අවශ්‍ය විටෙක අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබා දෙන උපදෙස් / අනුමැතිය අනුව පුද්ගලික නීතිඥයින්ගෙන් නීති උපදෙස් / සේවාවන් ලබා ගනී. නීති හා මානව සම්පත් අංශය විසින් අවශ්‍ය අවස්ථාවලදී වෘත්තීය සමිති සහ අනෙකුත් සංගම්වලට ඔවුන්ගේ කාර්යයන් /කටයුතු සිදු කිරීම සඳහා සේවකයින් සමඟ ඔවුන්ගේ ගැටළු සාකච්ඡා කිරීම සඳහා අවස්ථාව සලසා දෙමින් කටයුතු සිදු කරයි. නීති ප්‍රධානී සමාගම වෙනුවෙන් කම්කරු දෙපාර්තමේන්තුව, කම්කරු විනිශ්චය සභාව සහ වෙනත් ඕනෑම අධිකරණය ඉදිරියේ සමාගම නියෝජනය කරයි. 2022 වර්ෂය තුළ, අභියාචනාධිකරණ නඩු 01 ක්, බෙරුම්කරණ නඩු 01 ක් සහ කම්කරු කොමසාරිස්වරයාගේ විමර්ශන 3 ක් නීති හා මානව සම්පත් ප්‍රධානී විසින් මෙහෙයවා ඇත.

තවද, මෙම අංශය අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් කටයුතුවලට අදාළව මාසික පදනමක් මත අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සංවිධානය කර කැඳවනු ලබන අතර, අධ්‍යක්ෂ මණ්ඩල පොත්පත් සහ අධ්‍යක්ෂ මණ්ඩල සටහන් යනාදිය පිළියෙල කරනු ලබයි. 2007 අංක 07 දරණ සමාගම් පනතේ විධිවිධානවලට අනුව, වාර්ෂික මහා සභා රැස්වීමක් සංවිධානය කිරීමට හා සමාගම් රෙජිස්ට්‍රාර් සමඟ අවශ්‍ය ආකෘති පත්‍ර පිරවීම සඳහා පියවර ගෙන ඇත.

ප්‍රවාහනය

2022.12.31 දින වන විට රියදුරන් 9 දෙනෙක් සමඟ නීති හා මානව සම්පත් අංශය යටතේ ක්‍රියාත්මක ප්‍රවාහන අංශය සංචිත/පවරන ලද වාහන භාවිතා කරමින් කාලෝචිතව හා කාර්යක්ෂමව කටයුතු කර ඇත.

සංචිත වාහන 02 ක්, පවරන ලද වාහන 5 ක් සහ කුලියට ගත් 01 වාහනයක් ඇති අතර ඒවා සමාගමේ නිලධාරීන් සඳහා පවරා ඇත. සමාගමේ වාහන නඩත්තු කිරීම සුදුසු පරිදි නියමිත වේලාවට සිදු කරන ලදී.

විශේෂයෙන් COVID-19 වසංගත කාල පරිච්ඡේදය තුළ කාලෝචිත ආකාරයකින් සහ ඇතැම් අවස්ථාවලදී සමාගමේ සේවකයින් සඳහා ප්‍රවාහනය කළමනාකරණය කිරීමට සහ සැපයීමට දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් විය.

ආයතනික පාලනය

ආයතනික පාලනය යනු සියළුම පාර්ශ්වකරුවන්ගේ පොදු යහපත උදෙසා සංවිධානයේ සම්පත් ඵලදායී ලෙස භාවිතා කිරීම සහ ආයතනය මෙහෙයවීම සහ පාලනය සඳහා ආයතන විසින් ස්ථාපිත කරනු ලබන යාන්ත්‍රණයයි. යහපාලනය සඳහා මූලික වගකීම සමාගමේ සභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරේ. අධ්‍යක්ෂ මණ්ඩලය සිය සමාගම්වල පාලනය සඳහා වගකිව යුතුය. අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම් අතරට සමාගමේ උපායමාර්ගික අරමුණු සැකසීම, ඒවා ක්‍රියාවට නැංවීමට නායකත්වය සැපයීම, ව්‍යාපාරයේ කළමනාකරණය අධීක්ෂණය කිරීම සහ එහි භාරකාරත්වය පිළිබඳව කොටස් හිමියන්ට වාර්තා කිරීම ඇතුළත් වේ.

සමාගමේ පාලනය සඳහා ද අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතුය. මනා ව්‍යවහාර සහතික කිරීම සඳහා සමාගම විසින් නීති සහ රෙගුලාසි, ව්‍යුහයන් සහ ක්‍රියාවලීන් සංවර්ධනය කිරීම කෙරෙහි සැලකිය යුතු අවධානයක් යොමු කරයි.

2022 මූල්‍ය වසර තුළ ආයතනික යහපාලන ව්‍යවහාරවල මූලධර්ම සමාගම විසින් යොදා ගත් ක්‍රම මඟින් අධ්‍යක්ෂ මණ්ඩලයේ ආයතනික තීරණ ව්‍යවස්ථාපිත සහ නෛතික අවශ්‍යතාවන්ට අනුකූලව මහ භාණ්ඩාගාරය සහ වරාය සහ නාවික කටයුතු අමාත්‍යාංශය විසින් දෙන ලද උපදෙස් අනුගමනය කරමින් විගණන කමිටුව සහ අභ්‍යන්තර විගණනයන් විසින් සියුම්ව පරීක්ෂා කරන ලදී.

විගණන කමිටු වාර්තාව

“මූල්‍ය වාර්තාකරණය, අභ්‍යන්තර පාලනයන් සහ අවදානම් කළමනාකරණය, නෛතික හා නියාමන අවශ්‍යතාවන්ට අනුකූලතාව, බාහිර විගණන සහ සමාගමේ අභ්‍යන්තර විගණන කාර්යයේ ප්‍රමාණතාව සහ කාර්යසාධනය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අධීක්ෂණ වගකීම් සපුරාලමින් එහි වගකීම් මුදාහැරීමේදී මෙම කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලයට සහය වේ.”

කමිටුවේ සංයුතිය සහ පැමිණීම

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව (“BAC”) විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සමන්විත වන අතර ඔවුන්ගෙන් බහුතරයක් ස්වාධීන සහ නියාමක විසින් දක්වා ඇති සංයුතිමය අවශ්‍යතාවන්ට අනුකූල වේ. පැමිණීම සහ අධ්‍යක්ෂවරුන්ගේ තත්ත්වය පහත වගුවේ දක්වා ඇත.

නම	තත්ත්වය	සාමාජිකත්වය	පැමිණීම	කාලරාමුව
එම්.ඒ.අයි.එස්.එන්.කේ. මන්ත්‍රිනායක මයා	ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ (භාණ්ඩාගාරයේ නියෝජිත)	සභාපති	2/2	ජනවාරි-පෙබරවාරි 2022
ඒ. ප්‍රියන්ත මයා	ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ	සාමාජික	0/2	ජනවාරි-පෙබරවාරි 2022
ආර්.පී.ඒ. නිරෝෂන් සිරිවර්ධන මයා	ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ	සාමාජික	2/2	ජනවාරි-පෙබරවාරි 2022
දිල්ෂාන් සිල්වා මයා	ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ	සාමාජික	2/2	ජනවාරි-පෙබරවාරි 2022

කේ.ඒ.ඒ.කුලතුංග මයා	විගණන අධිකාරී (විගණකාධිපතිගේ නියෝජිත)	නිරීක්ෂක	4/4	ජනවාරි- දෙසැම්බර් 2022
හර්මන් ප්‍රනාන්දු මයා	ප්‍රධාන අභ්‍යන්තර විගණක (වරාය සහ නාවික අමාත්‍යාංශය)	නිරීක්ෂක	1/1	ජනවාරි 2022
එන්.ඒ.හිමාලි කමලා විජේරත්න මිය	ප්‍රධාන අභ්‍යන්තර විගණක (වරාය සහ නාවික අමාත්‍යාංශය)	නිරීක්ෂක	3/3	පෙබරවාරි - දෙසැම්බර් 2022
කේ.ඩී. බර්නාඩ් මයා	ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ	සාමාජික	1/2	ඔක්තෝබර් – දෙසැම්බර් - 2022
බී.ආර්.එල්. ගුණවර්ධන මයා	ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ	සාමාජික	2/2	ඔක්තෝබර් – දෙසැම්බර් - 2022
සී.ඩබ්.කේ.ධර්මසේන මයා	ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ (භාණ්ඩාගාරයේ නියෝජිත)	සභාපති	2/2	ඔක්තෝබර් – දෙසැම්බර් - 2022

කළමනාකරණ අධ්‍යක්ෂක සහ සියලුම අංශ ප්‍රධානින්, JCT සමාගමේ අභ්‍යන්තර විගණක නිරතුරුව මේ සඳහා ආරාධනය අනුව සහභාගි වෙති.

පරමාර්ථ

කමිටුව පහත කටයුතු කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බලය පවරා ඇත:

- අධ්‍යක්ෂ මණ්ඩලයට, නියාමකයින්ට සහ කොටස් හිමියන්ට නිවැරදි සහ කාලෝචිත මූල්‍ය තොරතුරු සැපයීම සඳහා මූල්‍ය වාර්තාකරණ පද්ධතිය මනාව කළමනාකරණය කර ඵලදායී බවට සහතික වීම.
- ගිණුම්කරණ ප්‍රතිපත්තිවල යෝග්‍යතාවය සමාලෝචනය කිරීම සහ ව්‍යවස්ථාපිත සහ නියාමන අනුකූලතා අවශ්‍යතා සහ අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන් පිළිපැදීම සහතික කිරීම.
- පවත්නා සහ පරිනාමනය වන අවදානම් වැළැක්වීම, අවම කිරීම හෝ මාරු කිරීම සඳහා පිහිටුවා ඇති අවදානම් කළමනාකරණය, අභ්‍යන්තර පාලන සහ පාලන පද්ධතිවල යෝග්‍යතාවය, සඵලත්වය සහ කාර්යක්ෂමතාව පරීක්ෂා කිරීම.
- ව්‍යාපාරයේ හැසිරීම රටේ අදාළ නීති සහ රෙගුලාසි අනුගමනය කරන බවත් සහ සමාගමේ ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටිවලට අයත් වන බවත් සහතික කිරීම.
- සියලුම පාර්ශ්වකරුවන්ගේ උපරිම යහපත සඳහා ඉහළම සදාචාරාත්මක ප්‍රමිතීන් සහ මනා කර්මාන්ත පරිචයන් තහවුරු කරමින් සමාගම ශක්තිමත් ආයතනික පාලන ප්‍රමිතීන් අනුගමනය කරන බව තහවුරු කිරීම.
- කළමනාකරණයට සොයාගැනීම් සහ නිර්දේශ ලබා දීම සඳහා අභ්‍යන්තර හා බාහිර විගණනයේ සියලුම ක්ෂේත්‍ර අධීක්ෂණය කිරීම.

• අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කිරීමට පෙර, හෙළිදරව් කිරීම් සඳහා සකස් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල අවංකකම සහතික කිරීම් සඳහා සමාගමේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීම.

• නව ගිණුම්කරණ ප්‍රමිතිවල බලපෑම් සාකච්ඡා කර අනාවරණය කරන බවට සහතික කිරීම.

• ස්වාධීනත්වය සහ විෂයමූලිකත්වය නිරීක්ෂණය කිරීම් ඇතුළුව අභ්‍යන්තර, බාහිර සහ බාහිරින් ලබාගත් විගණකගේ/විගණකවරුන්ගේ කටයුතු සහ කාර්යසාධනය නියාමනය කිරීම් සහ සමාලෝචනය කිරීම.

2022 දී කටයුතු

01.රැස්වීම්:

වසර තුළ විගණන කමිටුව රැස්වීම් හතරක් (4) පවත්වන ලදී. මෙම එක් එක් රැස්වීම්වලදී කමිටු සාමාජිකයින්ගේ පැමිණීම පිළිබඳ විස්තර ඉහත වගුවේ දක්වා ඇත. සමාගමේ බාහිර විගණකගේ නියෝජිතයින්, රජයේ විගණක නිරීක්ෂකයෙන් ලෙස ආරාධනය අනුව රැස්වීම් 4කට සහභාගි වී ඇත. එමෙන්ම කමිටුව අවශ්‍ය පරිදි වරින් වර රැස්වීම්වල සහභාගිවීමට සමාගමේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණයට ආරාධනය කර ඇත.

02. අභ්‍යන්තර විගණනය, අවදානම් සහ පාලනය

කමිටුව අභ්‍යන්තර විගණන කාර්යයේ ඵලදායිත්වය නියාමනය කරන අතර සමාගමේ අභ්‍යන්තර පාලන පද්ධතිවල ඵලදායිත්වය සහතික කිරීම් සඳහා වගකීමට බැඳී සිටී.

වසර තුළ, කමිටුව අභ්‍යන්තර පාලන සැලැස්ම සමාලෝචනය කරන ලද අතර වෙනස්වීම් නිර්දේශ කර, ප්‍රගතිය නිරන්තර පදනමක් මත නියාමනය කරන ලදී.

අභ්‍යන්තර විගණනය ප්‍රධාන කාර්යාලයේ සියලුම කාර්යයන් මෙන්ම දකුණු ජැටියේ සියලුම කටයුතු හා සම්බන්ධ වන අතර, එයට ප්‍රමාණතාව පිළිබඳ ඇගයීමක්, අභ්‍යන්තර පාලනයේ ඵලදායිත්වය සහ කාර්යක්ෂමතාව, මෙන්ම මෙහෙයුම් සහ ව්‍යාපාර අවදානම් අවම කිරීමට ගනු ලබන ක්‍රියා ඇතුළත්ය. ඊට අමතරව, අභ්‍යන්තර විගණනය ව්‍යවස්ථාපිත රෙගුලාසි සහ සමාගමේ ගිණුම්කරණ සහ මෙහෙයුම් ප්‍රතිපත්ති පිළිබඳ නියාමනය කර වාර්තා කරයි. අභ්‍යන්තර විගණන නියෝජිතයින් ඔවුන්ට අදාළ විගණන වාර්තා සම්බන්ධයෙන් සාකච්ඡා කරන අවස්ථාවේදී විගණන කමිටු රැස්වීම්වලට සහභාගි වේ.

අභ්‍යන්තර විගණන කාර්යය ස්වාධීන බවට සහ එහි විගණන කාර්යය අපක්ෂපාතීව, දක්ෂතාව සහ වෘත්තීමය සැලකිල්ල අනුව කටයුතු කරන බව කමිටුව සහතික කරන ලදී.

කමිටුව වාර්ෂිකව අභ්‍යන්තර විගණන කාර්යයේ ස්වාධීනත්වය සහ සම්පත් වාර්ෂිකව ඇගයීමට ලක් කරයි. ප්‍රගතිය, මූලික විගණන සොයා ගැනීම්, ප්‍රතිඵලවලින් සමන්විත අභ්‍යන්තර විගණන උපායමාර්ගය ජය කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ් හී අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ ලබා දේ.

ජයා කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ්

මූල්‍ය ප්‍රකාශන

2022 දෙසැම්බර් 31

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. PAS/C/JCTL/1/2022/2

ඔබගේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2023 මැයි 17

සභාපති

ජයා කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ්

ජයා කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ් හි 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න

විගණකාධිපති

පිටපත්: 1. ලේකම් - මුදල් අමාත්‍යාංශය

2. ලේකම් - වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශය

3. සභාපති - ශ්‍රී ලංකා වරාය අධිකාරිය

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. PAS/C/JCTL/1/2022/2 | මගේ අංකය உமது இல. Your No. | දිනය திகதி Date 2023 මැයි 17

සභාපති

ජයා කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ්

ජයා කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ් හි 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ජයා කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ් ("සමාගම") හි 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වෙනත් ලාභ හා අලාභ ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවියයුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) සමාගමේ සේවකයන් විසින් ලැබිය යුතු හිඟ ජීවන වියදම් දීමනාව සම්බන්ධයෙන් කරන ලද පැමිණිල්ලට අනුව කම්කරු දෙපාර්තමේන්තුව විසින් රු.19,164,600 ක් සේවකයන්ට ගෙවීමට නියෝග කර තිබුණු අතර අදාල මුදල 2021 මැයි 17 දින හෝ එදිනට පෙර කම්කරු

දෙපාර්තමේන්තුව වෙත ගෙවන ලෙස දන්වා තිබුණි. අදාල නියෝගය සම්බන්ධයෙන් සමාගම 2022 ජූලි 11 දින කම්කරු දෙපාර්තමේන්තුවටට අභියාචනයක් ඉදිරිපත් කර තිබුණි. කෙසේ වුවද, අදාල නියෝගය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 37 අනුව 2022 මූල්‍ය ප්‍රකාශන වල අවශ්‍ය හෙළිදරව් කිරීම් කර නොතිබුණි.

(ආ) නැව් තෙල් බලපත්‍රලාභියකු කාර්තුවක් තුල ප්‍රයෝජනයටගත් සාමාන්‍ය ඉඩ භාවිතය (Average space utilization) එකහ වූ අවම ඉඩ භාවිතයට (Minimum space utilization) වඩා අඩු වේ නම් දඩ මුදලක් අය කල යුතු අතර සමාගමේ ගණනය කිරීම අනුව 2022 වර්ෂය සඳහා අය කල යුතු දඩ මුදලින් සමාගමට හිමි විය යුතු රු. 1,007,158ක් වූ දඩ මුදල ගිණුම්වලට ගෙන නොතිබුණි.

(ඇ) සමාගම නැව් තෙල් බලපත්‍රලාභියා සමග අත්සන් කරන ලද ගිවිසුමෙහි ගාස්තු ලේඛණයේ දඩ මුදල ගණනය කිරීම සඳහා යොදාගත යුතු නිර්ණායක 6.1 වගන්තිය සරල හා පැහැදිලිව සඳහන් නොවන අතර 2021 හා 2022 වර්ෂයන්හි දී ගාස්තු ක්‍රමවේදය වෙනස් වී ඇත. එනම් 2021 වර්ෂයෙදී කාර්තුවක් තුල ප්‍රයෝජනයටගත් සාමාන්‍ය ඉඩ භාවිතය (Average Space Utilization) එකඟවූ අවම ඉඩ භාවිතයට (Mining Utilization) වඩා අඩුවේ නම් මසකට ඇමරිකා එක්සත් ජනපද ඩොලර් 10+VAT+NBT අය කර ඇති අතර 2022 වර්ෂයේදී ගිවිසුමේ ඇමුණුම් 04 හි සඳහන් වෙන් කල ඉඩ ප්‍රමාණයෙන් (Space Utilization) 12 න් කොටසකට මෙ:ටෝ: 1ක් සඳහා මසකට ඇ:ඩෝ:10 බැගින් අයකර ඇත. එම නිසා ගාස්තු අයකර ගැනීම නිශ්චිත නොවීම හේතුවෙන් 2022 වර්ෂයේ එම ආදායම නිවැරදිව ගණනය කිරීමට නොහැකි වී තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 සමාගමේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබාදීමට බලාපොරොත්තු වන සමාගමේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

සමාගමේ 2022 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය

කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අබණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2007 අංක 7 දරන සමාගම් පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 මගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2007 අංක 7 දරන සමාගම් පනතේ 163 (2) (ඇ) වගන්තියේ සහ 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සමාගම පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ දක්වා ඇති නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2. අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සමාගම සම්බන්ධවී යම් ගිවිසුමක්

සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියාකර ඇති බව.

	නීතිරීති / විධානයට යොමුව	නිරීක්ෂණ
(අ)	2022 සැප්තැම්බර් 20 දිනැති අංක 25/2022 දරණ සමාජ ආරක්ෂණ දායකත්වය බදු පනතේ 3(1) වගන්තිය	2022 ඔක්තෝබර් 01 දින සිට ආයතනය විසින් සපයනු ලබන සේවාවන් සඳහා අයකරනු ලබන ගාස්තු වලට අදාල බදු මුදල් එකතු කර දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කල යුතු වුවද, සමාගමේ එක් සේවාවක් වන නැව් වලට සපයනු ලබන තෙල් සඳහා ලැබිය යුතු රු.2,960,567 ක බදු මුදලක් අය කරගෙන නොතිබුණි.
(ආ)	1954 අගෝස්තු 9 දිනැති අංක 19 දරණ සාජ්පු හා කාර්යාල සේවක පනතේ I කොටසේ 3 වන වගන්තිය	යම් ආයතනයක් සේවකයන් වැඩමුර ක්‍රමයට සේවයේ යොදවයි නම් දිනකට උපරිම පැය 8 කට හා සතියකට පැය 45 කට සීමා විය යුතු වුවත් ඊට අනුකූල නොවන ලෙස සමාගම විසින් 2022 වර්ෂයේදී මෙහෙයුම් කාර්ය මණ්ඩලයේ සේවකයින් 40 දෙනෙකු පැය 24 ක වැඩමුර සඳහා සේවයේ යොදවා තිබුණු අතර සේවය ලබාගෙන තිබුණේ සතියකට දින 02ක් පමණි.
(ඇ)	2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 9.8 (ඇ) වගන්තිය	විද්‍යුත් මාධ්‍යයෙන් ලංසු ඉදිරිපත් කිරීමට අවසර දෙනු නොලබන නමුත් ඊට අනුකූල නොවන ලෙස ලංසු ඉදිරිපත් කිරීම සඳහා විද්‍යුත් තැපෑල (jctfinance@gmail.com) භාවිතා කල හැකි බව සඳහන් කරමින් වටිනාකම රු.12,763,559ක් වූ මිලදී ගැනීම් අවස්ථා 03ක් සඳහා ලංසු ඇරයුම් පිළියෙලකර ඉදිරිපත්කර තිබුණි.
(ඈ)	2020 ජනවාරි 27 දිනැති අංක PED 01/2020 දරන මුදල්	සමාගම විසින් ජනතාව වෙත කාර්යක්ෂම සේවාවක් සැපයීමට පිරිවැයට උපරිම ප්‍රතිලාභයක් ලැබෙන ලෙස

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද චක්‍රලේඛයේ 3 (ඇ) වගන්තිය	නව අයවැය හා ව්‍යදම් වැඩසටහන් සැකසිය යුතු අතර එහි ප්‍රචාරක දැන්වීම් පල කිරීම විශේෂයෙන් පාලනය කල යුතු කරුණක් ලෙස දක්වා තිබුණද තෙල් ටැංකි විවෘත කිරීම සම්බන්ධයෙන් පුවත්පත් දැන්වීම් පලකිරීම සඳහා රු.562,864ක් ඇතුළුව උත්සවයක් සඳහා 2022 ජනවාරි 19 වන දින රු.3,506,624ක් වැය කර තිබුණි.
(ඉ) 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය සමග නිකුත් කර ඇති රාජ්‍ය ව්‍යාපාර සඳහා වූ මෙහෙයුම් අත්පොත (Operational Manual)	
(i) 3.2 (ii) වගන්තිය	සමාගම සඳහා විධිමත් බඳවා ගැනීමේ පරිපාටියක් සකස්කර ඒ සඳහා අදාල අනුමැතීන් ලබාගෙන නොතිබුණි.
(ii) 3.3(ii) වගන්තිය	සෑම රාජ්‍ය ව්‍යාපාරයක් විසින්ම අනුමත සේවක සංඛ්‍යාව සමග සංවිධාන සටහන සකස් කර තිබිය යුතු වුවත්, සමාගම එම අවශ්‍යතාවය ඉටුකර නොතිබුණි.
(ඊ) 2017 අගෝස්තු 14 දිනැති අංක එන්පි/එස්පි/එස්ඩීජී/17 දරණ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද ලිපිය	තිරසාර සංවර්ධන පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර "2030 න්‍යාය පත්‍රය" අනුව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර ඒ අනුව තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ලගා විය යුතු ආකාරය, ඉලක්ක මැන බැලීම සඳහා දර්ශකයන් හඳුනාගෙන අවශ්‍ය කටයුතු සිදු කර නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර සමාගමේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

සමාගම විසින් මිලදීගෙන තිබූ රු.6,420,000ක් වූ තාක්ෂණික ස්වරූපයෙන් යුතු ඉන්ධන සැපයුම් කටයුතු සඳහා භාවිතා කරන Loading Arm උපකරණය ප්‍රසම්පාදනය කිරීම සඳහා වෙළඳපොල මිල සැදහුම් ක්‍රමය භාවිතා කර තිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙහි 3.4.1 (අ) හි එම ක්‍රමය භාවිතා කර ප්‍රසම්පාදනය කලයුතු භාණ්ඩවල ස්වභාවය පැහැදිලිව දක්වා තිබියදී ජාතික තරහකාරී ලංසු පටිපාටිය භාවිතා නොකොට වෙළඳපොල මිල සැදහුම් ක්‍රමය භාවිතා කිරීම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1 (ඇ) හි විධිවිධානයන්ට අනුකූල නොවීමක් විය.

2.3 වෙනත් කරුණු

(අ) මෙට්‍රික් ටොන් 1100 ක ධාරිතාවයෙන් යුතු අංක 105 දරණ තෙල් ටැංකියෙහි 2022 දෙසැම්බර් 31 දිනට 380 (HSFO) මෙට්‍රික් ටොන් 275 ක් ගබඩා කර තිබුණි. එහි ශ්‍රී ලංකා වරාය අධිකාරියට අයත් මෙට්‍රික් ටොන් 72 ක් ද පෞද්ගලික බලපත්‍රලාභී ආයතන වලට අයත් මෙට්‍රික් ටොන් 40 ක් ද, ශ්‍රී ලංකා රේගුව විසින් රඳවාගත් මෙට්‍රික් ටොන් 162 ක්ද පැවතුණි. රේගුව විසින් මෙම තෙල් ටැංකිය මුද්‍රා තබා ඇති බැවින් මෙහෙයුම් කටයුතු සඳහා භාවිතයට ගත නොහැකිව නිෂ්කාර්යව තිබුණි.

(ආ) සමාගමෙහි ටැංකි අංක 102 හි 2008 වර්ෂයේ සිට ගබඩා කර ඇති ශ්‍රී ලංකා වරාය අධිකාරියට අයත් HFO වර්ගයේ තෙල් මෙට්‍රික් ටොන් 72.706 ක් ඉවත් කර නොගැනීම නිසා ශ්‍රී ලංකා රේගුවේ අනුමැතියට යටත්ව වෙන්දේසි කිරීම සඳහා 2021 ජනවාරි 26 දිනැති අංක JCT/12/2021 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව අනුමැතිය ලැබී තිබුණද මෙතෙක් එම කාර්යය අවසන්වී නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

ලාභාලාභ ප්‍රකාශය
2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර

	සටහන්	2022 රු.	2021 රු.
ආදායම	3	**608,028,143**	**297,763,569**
විකුණුම් පිරිවැය	25	(192,182,027)	(133,785,314)
දළ ලාභය		415,846,116	163,978,255
පරිපාලන වියදම්	26	(126,459,095)	(100,120,227)
මෙහෙයුම් ලාභය/(අලාභය)		**289,387,021**	**63,858,028**
මෙහෙයුම් නොවන ආදායම		291,563	3,704,695
මූල්‍ය ආදායම	4.1	49,481,953	17,230,071
මූල්‍ය පිරිවැය	4.2	(14,033,063)	(4,825,720)
බදු පෙර ලාභය		325,127,474	79,967,074
ආදායම් බදු වියදම්	14	(79,515,958)	(14,514,587)
බදු පසු ලාභය		**245,611,516**	**65,452,487**
කොටසකට ඉපයීම්	16	2456.12	654.52

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් පිටු අංක 8 සිට 25 දක්වා මූල්‍ය ප්‍රකාශනවල අත්‍යවශ්‍ය කොටසකි.

අනෙකුත් විස්තරාත්මක ආදායම් ප්‍රකාශය
2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර

	සටහන්	2022 රු.	2021 රු.
වසර සඳහා ලාභය		245,611,516	65,452,487
අනෙකුත් විස්තරාත්මක ආදායම			
පසු කාලසීමාව තුළ ලාභය හෝ අලාභයට නැවත වර්ගීකරණය කළ යුතු			
නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් මත ආයුගණක ලාභ/(අලාභය)	12	(5,401,659)	2,215,544
වසර සඳහා අනෙකුත් විස්තරාත්මක ආදායම - බද්දෙන් පසු	12	(5,401,659)	2,215,544
වසර සඳහා මුළු අනෙකුත් විස්තරාත්මක ආදායම - බද්දෙන් පසු		**240,209,857**	**67,668,031**

ගිණුම්කර ප්‍රතිපත්ති සහ සටහන් පිටු අංක 8 සිට 25 දක්වා සටහන් මූල්‍ය ප්‍රකාශනවල අත්‍යවශ්‍ය කොටසකි.

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය
2022 දෙසැම්බර් 31 දිනට

	සටහන	2022 රු.	2021 රු.
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපල, පිරියත හා උපකරණ	5	63,975,201	67,440,354
කල්බදු වත්කම්	5	27,685,183	31,136,144
මෙ.ටො. 3200 ටැංකි හා ගිනි පෙන සඳහා විලම්භිත වියදම්	5	152,554,415	137,881,056
මූල්‍ය වත්කම්			
සේවකයින්ට ලබාදුන් ණය	6	38,259,621	32,768,530
		244,214,799	**236,457,554**
අස්පෘශ්‍ය වත්කම්	5	290,000	-
		290,000	**-**
ජංගම වත්කම්			
අවසන් තොගය		4,654,482	2,296,796
වෙළෙඳ හා අනෙකුත් ලැබීම්	6	104,537,836	50,156,667
අනෙකුත් ජංගම මූල්‍ය වත්කම්	7	398,128,670	216,812,695
මුදල් හා මුදලට සමාන දෑ	8	164,064,531	69,123,451
		671,675,519	371,158,139
මුළු වත්කම්		**954,149,940**	**607,615,693**
ස්කන්ධය හා වගකීම්			
ප්‍රකාශිත ප්‍රාග්ධනය	9	1,000,000	1,000,000
රඳවාගත් ඉපයීම්		680,787,987	462,055,920
මුළු ස්කන්ධය		**681,787,987**	**463,055,920**

ජංගම නොවන වගකීම්			
පොළිය දරන ණය සහ ණය ගැනීම්	10	85,198,610	84,075,493
මූල්‍ය කල්බදු බැඳීම	11	3,508,659	8,248,692
සේවක ප්‍රතිලාභ වගකීම	12	19,212,174	12,130,412
		107,919,443	**104,454,597**
ජංගම වගකීම්			
